# Path to Success - Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## බුද්ධ ධර්මය - 9 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැළණිය

## උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී.ඉරෝෂණී කේ. පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

## මෙහෙයවීම හා සංවිධානය

එෆ්.එච්.ජේ.පී.සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

## විෂය සම්බන්ධීකරණය

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

## සැකසුම

කේ.පී.අනුෂා කුමාරි මිය

බප/කැළ/මහාමායා බාලිකා විද්‍යාලය, කඩවත

ඩබ්.එම්.පී.කේ.පල්ලේපිටිය මිය

බප/කැළ/කොහල්විල චන්ද්‍රරතන විද්‍යාලය

-සියලුම හිමිකම් ඇවිරිණි-

# 17පාඩම

# හේතුව ඵලය වෙයි.
# ඵලය හේතුව වෙයි.

- බුදු දහමේ මූලික ඉගැන්වීම් කිහිපයකි .එනම්
  - ත්‍රිලක්ෂණය
  - පුනර්භවය
  - කර්මය
  - හේතුඵල දහම -පටිච්ච සමුප්පාද ධර්මය බුදු දහමේ මූලිකම ඉගැන්වීමයි.
  - චතුරාර්ය සත්‍යය
- පටිච්ච සමුප්පාදය හඳුන්වන තවත් නමක් වන්නේ හේතුඵල දහමයි.
  - කිසිවක් අහේතුකව ඉබේ සිදුවන්නේ නැත .හැම දෙයකටම හේතුඵල ධර්මය අදාළ වේ
    - උදා -1 .හොඳින් පාඩම් කළ නිසා විභාගය සමත් වීම
      2 . හොඳින් පාඩම් නොකළහොත් විභාගය අසමත් වීම
- හේතුව හොඳ නම් ඵලය ද යහපත්ය.
  හේතුව අයහපත් නම් ඵලය ද අයහපත්ය.
- බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්ව පළමු සතියේ පස්වන දින රාත්‍රියේ ඇසතු බෝමැඩ අසලදී පටිච්ච සමුප්පාදය,
  - අනුලෝම -මුල සිට අගට
  - ප්‍රතිලෝම -අග සිට මුලට

  මෙනෙහි කළ සේක.
- “යමෙක් ධර්මය දකී ද ඔහු පටිච්ච සමුප්පාද ධර්මය දකී.”
  ) යෝ ධම්මං පස්සති ,සෝ ධම්මං පස්සති(.
  - අස්සජි මහ රහතන් වහන්සේ උපතිස්ස කෝලිත දෙදෙනාට දේශනා කළ පළමු දහම වූයේ හේතු-ඵල දහමයි.
  - “යේ ධම්මා හේතුප්පභවා-තේසං හේතු තථාගතෝ ආහ
    තේසංච යෝ නිරෝධෝ -ඒවං වාදී මහා සමණෝ”
    )හේතු නිසා හටගන්නා යම් ධර්මතා වේද ඒවායේ හේතුව බුදුන් වහන්සේ දේශනා කළහ .එම ධර්මවල නැතිවීම ද බුදුන් වහන්සේ දේශනා කළ සේක.
- **<u>පටිච්ච සමුප්පාද සූත්‍ර න්‍යාය</u>**
  - ඉමස්මිං සති ඉදං හෝති-
    - මෙය ඇති කල්හි මෙය ඇතිවේ ) .වළාකුළු ඇති කල්හි වැස්ස ඇතිවේ(.
  - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති-
    - මෙය හට ගැනීමෙන් මෙය හට ගනී).වැස්ස ඇති කළ තෙතමනය ඇතිවේ . එමගින් තුරුලතා ඇතිවේ .තුරුලතා වලින් වළාකුළු ඇතිවේ(.
  - ඉමස්මිං අසති ඉදං න හෝති-
    - මෙය නැති කල්හි මෙය ඇති නොවේ).වළාකුළු නැති කළ වැස්ස නැත(.
  - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති-
    - මෙය නැතිවීමෙන් මෙය නැතිවේ).වැස්ස නැති කළ තෙතමනය නැත . තෙතමනය නැති කළ තුරු ලතා නැත.තුරුලතා නැති කළ වළාකුළු නැත(.

- අනුලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක් ඇතිවන ආකාරය පෙන්වා දී ඇත .එය

**ද්වාදසාංග පටිච්ච සමුප්පාදය** තුළින් පැහැදිළි කර ඇත.

- අවිද්‍යාව නිසා සංඛාර ඇතිවේ → සංඛාර නිසා විඤ්ඤාණ ඇතිවේ.
- විඤ්ඤාණ නිසා නාමරූප ඇතිවේ → නාම රූප නිසා සළායතන ඇතිවේ.
- සළායතන නිසා ස්පර්ශය ඇතිවේ → .ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ.
- වේදනාව නිසා තණ්හාව ඇතිවේ → .තණ්හාව නිසා උපාදාන ඇතිවේ.
- උපාදානය නිසා භවය ඇතිවේ → .භවය නිසා ඉපදීම ඇතිවේ.
- ඉපදීම නිසා ජරා මරණ ඇතිවේ.

❖ පටිලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක් නැතිවන ආකාරය පෙන්වා දී ඇත.
- අවිද්‍යාව නැති වීමෙන් සංඛාර නැතිවේ.
- සංඛාර නැතිවීමෙන් විඤ්ඤාණය නැතිවේ .ආදී වශයෙනි.

❖ මෙය පුද්ගලයා තුළ දුක ඇතිවන ආකාරය හා නැතිවන ආකාරය ලෙස හැඳින්වේ.

❖ තණ්හාව මුල් කරගෙන සමාජයේ කලකෝළහාල ඇතිවන අයුරු පටිච්ච සමුප්පාද සූත්‍රයට අනුව සිදුවන බව ,චක්කවත්ති සීහනාද සූත්‍රයේ සහ මහා නිදාන සූත්‍ර ආදියේ දක්වා ඇත.

❖ **පාලකයා දිළින්දන්ට ධනය නොදීම නිසා ,**
- ○ දිළිඳුකම ඇතිවේ.
- ○ දිළිඳුකම නිසා සොරකම ඇතිවේ.
- ○ සොරකම නිසා ආයුධ ගනිති.
- ○ ආයුධ ගැනීම නිසා ප්‍රාණඝාතය ඇතිවේ.
- ○ ප්‍රාණඝාතය නිසා බොරුව ඇතිවේ .
- ○ බොරුව නිසා කේළම ,පරුෂ වචන ආදී දුරාචාර ඇතිවේ.

❖ **මෙය සමාජගත දුක ඇතිවන ආකාරයයි.**

❖ **සමාජගත දුක නැතිවන ආකාරය ද පටිච්ච සමුප්පාද න්‍යාය අනුව සිදුවේ.**

❖ **පාලකයා දිළින්දන් ට ධනය දීම නිසා,**
- ○ දිළිඳුකම නැතිවේ.
- ○ දිළිඳුකම නැතිවීම නිසා සොරකම නැතිවේ ..................ආදී වශයෙනි.

❖ පාසල් ශිෂ්‍යයන් වශයෙන් පටිච්ච සමුප්පාද ධර්මය ඔබ හටද වැදගත්ය .
- පාඩම් නොකරන දරුවෝ විභාගය අසමත් වනවා සේම පාඩම් කරන දරුවෝ විභාගය සමත් වෙති .
- හොද වැඩ කරන දරුවෝ සමාජයේ ගෞරවයට පාත්‍ර වනවා සේම වැරදි වැඩ කරන දරුවෝ සමාජයේ අපවාදයට ලක් වෙති.

## ක්‍රියාකාරකම-:

1) බුදු දහමේ මූලික ඉගැන්වීම් 03ක් නම් කරන්න.
2) පටිච්ච සමුප්පාද ධර්මයේ කෙටි සූත්‍රය ලියන්න.
3) අස්සජි මහ තෙරුන් වහන්සේ උපතිස්ස තාපසයාට දේශනා කළ ගාථාව සහ එහි තේරුම ලියන්න.
4) පුද්ගලයාගේ දුක නැතිවන ආකාරය ලියා දක්වන්න).අවිද්‍යාව නැතිවීම නිසා සංඛාර නැතිවේ ...........ආදී ලෙසින්(
5) සමාජගත දුක නැතිවන ආකාරය ලියන්න.
6) පටිච්ච සමුප්පාද සූත්‍රය ඉගෙනීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

18 පාඩම

# සාමකාමී ජීවිතයක් ගත කරමු.

ජීවී සහ අජීවී පරිසරය කෙරෙහි අප දැක්විය යුතු ආකල්පය පිළිබඳ බුද්ධ දේශනා ඇසුරෙන් සාකච්ඡා කිරීම මෙම පාඩමේ දී සිදු කෙරේ.

- බුදුන් වහන්සේ සියලු සත්ත්වයන් වෙත මහා කරුණාවෙන් යුතුව කටයුතු කල ආකාරය බුද්ධ චරිතය ඇසුරෙන් පැහැදිලි වේ.
- වරක් බුදුන්වහන්සේ අහිංසක ගොවියෙකුගේ නිර්දෝෂීභාවය සනාථ කිරීම පිණිස අණාඳ හිමියන් සමඟ එම ගොවියා සීසාමින් සිටි කුඹුරටද වැඩම කළහ.
- බෞද්ධයාගේ නිත්‍ය සීලය වූ පංච සීලයේ පළමු ශික්ෂාවෙන්ද පැහැදිලි වන්නේ සියලු සත්ත්වයන් වෙත මෛත්‍රී සහගතව කටයුතු කළ යුතු බවයි. පණ ඇති සතුන් මැරීමෙන් වැළකීම මෙයින් පෙනෙන්නේ අවිහිංසාවාදී සංකල්පයයි.
- සෑම සත්ත්වයෙක්ම දඬුවමට හා මරණයට බිය වන බවත් තමා උපමා කරගෙන අනුන්නට හිංසා නොකළ යුතු බවත් බුද්ධ දේශනාවයි. එය අත්තූපනායික ධර්ම පරියාය ලෙස හැඳින්වේ.
- බුද්ධ කාලීන බ්‍රාහ්මණ සමාජයේ සතුන්ට හිංසා කරමින් ඝාතනය කරමින් විවිධ බිලි පූජා පවත්වන ලදී. එය යාගය ලෙස හැඳින්විය. යාගයේ දී ජීවින් පමණක් නොව ගස් වැල්ද විනාශ විය.

  බුදුදහම මෙම හිංසාවාදී යාගය ප්‍රතික්ෂේප කරමින් ඒ වෙනුවට දානය ආදේශ කරයි. දානයේ දී ගොඩනැගෙන්නේ දයාව කරුණාව අනුකම්පාව යන මානව ගුණාංගයන්ය.
- සියලු සත්ත්වයන් කෙරෙහිම මෛත්‍රිය දැක්විය යුතු බව කරණීය මෙත්ත සූත්‍රය , ඛන්ධ පිරිත වැනි සූත්‍ර වලින් අවධාරණය කර ඇත.

  පෙනෙන, නොපෙනෙන, ලඟ සිටින දුර සිටින විශාල සිරුරක් ඇති කෙටි සිරුරක් ඇති දෙපා , සිවුපා, බහුපා යනාදී සියලු සත්ත්වයන් කෙරෙහිම මෛත්‍රිය දැක්විය යුතු බවයි. එම සූත්‍රවල දක්වා ඇත්තේ.
- තමන්ව විනාශ කරන අදහසින් මහ කියතකින් තම ශරීරයේ කොටස් කෑලි වලට කපද්දිත් එම සොරුන් කෙරෙහි මෛත්‍රී සහගතව සිටිය යුතු බවයි. වරක් බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කළේ.
- රාජ්‍ය පාලකයින්ටද බුදුන්වහන්සේ දේශනා කළේ ධාර්මිකව පාලනය කරන ලෙසය. ඒ අනුව චක්කවත්තිසීහනාද සූත්‍රයේ දී දක්වා ඇත්තේ සිව්පාවුන්ට , පක්ෂීන්ට රැකවරණය ලබාදිය යුතු බවයි.

- වසල සූත්‍රයේ දී දක්වා ඇත්තේ ඇතැමුන්ගේ චර්යා රටා නිසා ඔවුන් වසල හෙවත් පහත් තත්ත්වයට පත්වන බවත්ය. එනම් සත්ත්ව ඝාතනය කරන්නා ප්‍රාණීන් කෙරෙහි දයාවක් නැති තැනැත්තා ගම් නියම්ගම් වනසන පුද්ගලයා , පහර දෙන පුද්ගලයා වසලයෙකු වන බවයි. එම සූත්‍රයේ දක්වා ඇත්තේ.

ඇතැම් රටවල ජාතීන් හා ආගම් අතර සිදුවන ගැටීම් සම්පූර්ණයෙන්ම බුදු දහමින් බැහැර කෙරේ.

බුදු දහම හැම විටම අවධාරණය කරන්නේ වෛරයෙන් වෛරය නොසන්සිදෙන බවත් අවෛරයෙන්ම වෛරය සන්සිදෙන බවත්ය.

අප විසින් අජීවි පරිසරය කෙරෙහිද (පරිසරය) හිතවාදිව කටයුතු කළ යුතුය.

මල නොතලා රොන් ගන්නා බඹරෙකු සේ ස්වභාවධර්මය කෙරෙහි ක්‍රියා කළ යුතු බව සඳහන් වේ.

- අප පරිසරයෙන් ප්‍රයෝජන ගත යුත්තේ පරිසරය හිත මිතුරෙකු ලෙස සලකමිනි.

## ක්‍රියාකාරකම

01. බුදුන් වහන්සේ සැවැත් නුවර අහිංසක ගොවියාට පිහිට වූ කතා පුවත කෙටියෙන් ලියන්න.
02. සියල්ලෝම දඬුවමට තැති ගනිත්, සියල්ලන්ටම ජීවිතය ප්‍රියය. ඒ නිසා තමා උපමා කොට අනුන් නොනැසිය යුතුය යන අදහස ගෙන දෙන ධම්මපද ගාථාව ලියන්න.
03. බුදුන් වහන්සේ ජීවි සත්ත්වයන්ට මෙන්ම අජීවි පරිසරය කෙරෙහිද හිතවාදිව කටයුතු කළ බවට නිදසුන් දෙකක් පැහැදිලි කරන්න.

## 19 පාඩම

## ආරෝග්‍යා පරමා ලාභා

- සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට කායික හා මානසික නීරෝගීතාවය වැදගත්ය.
- නීරෝගීමත් ජීවිතයකට මනා සෞඛ්‍ය පිළිවෙත් රැසක් ආරක්ෂා කළ යුතුය. බුද්ධ දේශනාවේද එම කරුණු අන්තර්ගතය
- පංචසීලයේ තුන්වන ශික්ෂාපදය වූ කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම නම් වූ සිල්පදයෙන් ශිෂ්ට සම්මත හැසිරීම අවධාරණය කරයි.

  එමඟින් භයානක මරාන්තික රෝග වලින් වැළකිය හැකිය.
- පංචසීලයේ පස්වන ශික්ෂා පදය වූ මදයට හා ප්‍රමාදයට හේතුවන මද්‍යසාර භාවිතයෙන් වැළකීම තුළින් ද නීරෝගීකම ලඟා කර ගත හැක.
- සිඟාලෝවාද සූත්‍රයේ ධනය විනාශවන ක්‍රම 6 අතරින් මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව අතර දැක්වෙන්නේ නොයෙක් රෝගාබාධ ඇති වීමයි.

  දුම්පානයෙන් වැළකීම තුළින් කායික මානසික රෝගාබාධ රැසකින් වැළකිය හැකිය.
- මිනිසුන්ගේ නිරෝගීබව නැතිකරන තවත් ප්‍රබල කරුණකි නොගැලපෙන ආහාර භාවිතය.
- ආහාර ගැනීමෙන් අපේක්ෂිත ප්‍රධාන කරුණු රැසක් බුදුසමය අවධාරණය කරයි.
- ප්‍රමාණයට වඩා ආහාර අනුභවය කායික පැවැත්මට හිතකර නොවන බව බුදුන් වහන්සේ කොසොල් රජුට දේශනා කළ සේක.
- ආහාර අධිපරිභෝජනය වර්තමානයේ කායික නීරෝගීතාවය නැති කරන ප්‍රබල සාධකයකි.
- බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන් වහන්සේලාගේ කායික සෞඛ්‍ය සෑම විටම ආරක්ෂා වන පරිදි විනය නීති රැසක් පනවා ඇත.

  උදා :- පැන් පානය කිමේ දී පෙරා පානය කිරීමට.

  පෙරහන් කඩක් භාවිතයට නියම කිරීම.
- ජලය පිරිසිදුව පවත්වා ගැනීමට ජලයට මළ මුත්‍ර කෙළ බැහැර නොකිරීමට නියම කිරීම.
- භික්ෂුන් වහන්සේලාගේ සිවුරු ආදිය පිරිසිදුව තබා ගැනීමට නියම කිරීම.
- භික්ෂුන් වැඩ සිටින ආවාස හා අවට පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමට නියම කිරීම.
- වැසිකිළි කැසිකිළි භාවිතය සම්බන්ධයෙන් විනයභානි රැසක් පනවා තිබීම.
- ශිෂ්‍ය ජීවිතයට ද නීරෝගීකම අතිශයින් වැදගත් සාධකයකි.

  ඉගෙන ගන්නා කරුණු නිවැරදිව මතක තබා ගැනීමට නීරෝගීකම වැදගත් වේ.
  - මනස එකඟ කරගෙන පවත්වාගෙන යාමට නිරෝගීකම වැදගත්ය.
  - ආරම්භ කළ දෙය අඛණ්ඩව පවත්වාගෙන යාමට නීරෝගීතාවය වැදගත්ය.

### ක්‍රියාකාරකම

01. මත්ද්‍රව්‍ය හා දුම්පානය වැනි විෂමචර්යා නිසා සිදුවන හානිය පිළිබඳ කරුණු 5 ක් ලියන්න.

02. ආහාර ගැනීමේ දී අපේක්ෂිත කරුණු මොනවා ද?

03. ආහාර අනුභවයේ දී අප සැළකිලිමත් විය යුතු කරුණු මෙසේ "නීරෝගීකම උතුම්ම ලාභයයි". තමා පිළිබඳ වාක්‍ය 5 ක් ලියන්න.

## 20 වන පාඩම

## ගැටලු විසඳන සසුන් පිළිවෙත

### දෙවන ධර්ම සංගායනාව

1 හේතුව - වජ්ජී පුත්තක භික්ෂුන් විසින් ක්‍රියාත්මක කරගෙන එනු ලැබූ විනය විරෝධි දස වස්තුව

1) කප්පති සිංගිලෝණ කප්පෝ - අගක ලුණු තබාගෙන භාවිතා කිරීම කැපය.

2) කප්පති ද්වංගුල කප්පෝ - හිරු අවරට ගොස් සෙවනැල්ල දෑගුලක් වනතුරු ආහාර අනුභවය කැපය.

3) කප්පති ආවාස කප්පෝ - මහාසීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙනම පොහොය කර්ම කිරීම කැපය.

4) කප්පති ආවාස කප්පෝ - මහා සීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙනම පොහොය කර්ම කිරීම කැපය.

5) කප්පති අනුමති කප්පො - විනය කම වලට නොපැමිණි භික්ෂුන්ගේ අනුමැතිය පසුව ලබාගන්නා අදහසින් සංඝ කර්ම කිරීම කැපය.

6) කප්පති ආචිණ්ණ කප්පෝ - ආචායයන් වහන්සේලා විසින් පුරුදු කරන ලද කැප හෝ අකැප දෑ සියල්ල ඒ ලෙසටම පිළිගැනීම කැපය.

7) කප්පති අමථිත කප්පෝ - කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි වැළඳීම කැපය.

8) කප්පති ජලෝගි පාතුං - නොපැසුණු සුරාපානය කැපය.

9) කප්පති අදසකට නිසීදනං - වාටි නොමැසු ඇද ඇතිරිලි පරිහරණය කැපය.

10) කප්පති ජාතරූප රජතං - රන් රිදී කහවනු පිළිගැනීම කැපය.

2 මූලිකත්වය - සබ්බකාමී මහරහතන් වහන්සේ

3 අනුග්‍රහය - කාලාශෝක රජතුමා

4 සහභාගී වූ පිරිස- මහරහතන් වහන්සේලා හත්සියයි

5 හැඳින් වූ නම් - සත්තසතික සංගීතිය

6 ස්ථානය - විශාලා මහනුවර වාලුකාරාමය

7 කාලය - බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු

8 ගත වූ කාලය - මාස අටයි

9 ප්‍රතිඵල :-

වජ්ජි පුත්තක භික්ෂුන් විසින් පිළිගන්නා ලද දස වස්තුව විනය විරෝධී යැයි ප්‍රතික්ෂේප වීම.

විනය නීති ලිහිල් නොකරීම.

දස වස්තුව පිළිගත් භික්ෂුන් වහන්සේලා මහා සාංඝික නමින් වෙනම නිකායක් පිහිටුවා ගැනීම.

### තෙවන ධර්ම සංගායනාව

01 හේතුව :- ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් සසුන්ගත වූ අන්‍ය ආගමික භික්ෂුන් වහන්සේලාගේ නොමනා ක්‍රියාකලාපය.

02 මූලිකත්වය - මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ

03 අනුග්‍රාහකත්වය- ධර්මාශෝක මහ රජතුමා

04 සහභාගී වූ පිරිස- මහරහතන් වහන්සේලා දාහයි

05 හැඳින් වූ නම් - සාහස්සිකා සංගීතිය

06 ස්ථානය - පැලලුප් නුවර අශෝකාරාමය

07 කාලය - බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස් හයකට පසුව

08 ගත වූ කාලය - මාස නවයයි

09 ප්‍රතිඵල -

1. දුර්මතධාරී භික්ෂුන් හැටදහසක් පමණ සසුනෙන් නෙරපා හැරීම
2. පොහොය කර්ම සාමූහිකව සිදු කිරීමට භික්ෂූන්ට හැකි වීම.
3. මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ විසින් කථා වත්ථුප්පකරණය නම් ග්‍රන්ථය රචනා කිරීම.
4. රටවල් නවයකට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර හැරීම.

| රට | නායකත්වය |
|---|---|
| කාශ්මීර ගන්ධාර | මජ්ඣන්තික හිමි ඇතුළු පිරිස |
| මහිස මණ්ඩලය | මහාදේව හිමි ඇතුළු පිරිස |
| වනවාසි දේශය | රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| අපරන්ත දේශය | යෝනක ධම්ම රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| මහා රට්ට | මහා ධම්ම රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| යෝනක දේශය | මහා රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| හිමවත් පෙදෙස | මජ්ඣිම හිමි ඇතුළු පිරිස |
| ස්වර්ණ භූමිය | සෝණ උත්තර හිමි ඇතුළු පිරිස |
| තම්බපණ්ණිය | මිහිඳු හිමි ඇතුළු පිරිස |

බුද්ධ ශාසනය තුළ ගැටළු පැන නැගි සෑම අවස්ථාවකදීම භික්ෂුන් වහන්සේලා සාමූහිකව එකතු වී සාකච්ඡා කර ඒවා සඳා ගත් ආකාරය සියලුම ධම සංගායනා වලින් පෙනියයි.

**ක්‍රියාකාරකම**

01. දෙවන හා තෙවන සංගායනා වලට අදාළ මූලික කරුණු වගුගත කොට දක්වන්න.

02. වජ්ජිපුත්තක භික්ෂුන්ගේ දස අකප වස්තුව නම් කරන්න.

03. තෙවන ධර්ම සංගායනාවේ දී බුදු දහම දේශාන්තර වශයෙන් ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරන්න.

## 21 පාඩම


## <u>සුරකිමු හෙළ කලා කෙත</u>

බෞද්ධ කලාව :- හරවත් වූ බෞද්ධ කලාවක් අපට දායාද වන්නේ මහින්දාගමනයෙන් පසුවයි.මේ සෑම බෞද්ධ කලාවකටම හරය වී ඇත්තේ බුදු දහම හා සම්බන්ධ පණිවිඩයයි.

උදා :- බෞද්ධ ස්තූපය , බුද්ධ ප්‍රතිමා , සඳකඩපහණ , මුරගල ,කොරවක්ගල , බෞද්ධ චිත්‍ර

බෞද්ධ ස්තූපය - මෙහි ආකෘති ගණනාවක් දක්නට ලැබේ. ගර්භයේ හැඩය අනුව මේවා වර්ග කෙරේ.

උදා :- බුබ්බුලාකාර , ඝටාකාර , ධාන්‍යාකාර ආදී වශයෙනි. ස්තූපයක අංග කීපයකි.




මෙම අංග මඟින් ගැඹුරු බෞද්ධ සංකල්ප සෞන්දර්යාත්මකව නිරූපනය කරන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහසයි.

බුද්ධ ප්‍රතිමා - ක්‍රි.ව. 1 වැනි සියවසේ දී පමණ බුද්ධ ප්‍රතිමා නිර්මාණය ආරම්භ වී ඇත.
උදා:- මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාව , තොළුවිල ප්‍රතිමාව , අවුකන ප්‍රතිමාව

මේවා මඟින් හෙළ කලා කරුවාගේ බොදු බැතියත් කලාකාමී නිර්මාණශීලි හැකියාවත් ප්‍රකට කෙරේ.

සඳකඩපහණ - බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසීම සඳහා ඇති පියගැට පෙළ පාමුල පිහිටි අර්ධකවාකාර ගල් පඩියකි. මෙහි තීරු වල බෞද්ධ නිර්මාණ දැකිය හැකිය. මින් සසර ගමන පිළිබඳව පණිඩයක් ලබා දෙන බව මහාචාර්ය සෙනරත් පරණ විතාන මහතා පවසයි.

බෞද්ධ සිතුවම් - මේ සඳහා ජාතක කථා , බුද්ධ චරිතය , ශාසන ඉතිහාසය වැනි දේ පසුබිම් වී ඇත. බොහෝ විට විහාරස්ථාන වල විහාර බිත්තියේ දාගැබ් ගර්භයේ ඇතුළත අඳින ලද බිතු සිතුවම් වලද බුදු සමයේ ආභාෂය දැකිය හැකිය. බෞද්ධ සිතුවම් දක්නට ඇති ස්ථාන ලෙස ,

| | | |
|---|---|---|
| අනුරාධපුර යුගය | - | හිඳගල , සීගි සිතුවම් |
| පොළොන්නරු යුගය | - | මහියංගණ චෛත්‍යය , තිවංක පිළිමගෙය , දිඹුලාගල |
| මහනුවර යුගය | - | ශ්‍රී දළදා මාළිගය |
| නූතන යුගය | - | කැලණි විහරයේ බිතු සිතුවම් |

බෞද්ධ සාහිත්‍යය :- මහින්දාගමනයෙන් අපට ලැබුණු තවත් වටිනා දායාදයකි බෞද්ධ සාහිත්‍යය.ගද්‍ය සාහිත්‍යය හා පද්‍ය සාහිත්‍යය යනුවෙන් වග දෙකකි. මේවාටද බුදු දහම වස්තු විෂය වී ඇත.

**<u>බෞද්ධ සාහිත්‍යයේ වටිනා ග්‍රන්ථ කතුවරු හා යුග</u>**

| යුගය | සාහිත්‍යය නිර්මාණය | කතෘවරයා | අරමුණු |
|---|---|---|---|
| අනුරාධපුර | සියබස්ලකර<br><br>සිඛවළඳ හා සිඛවළඳ විනිස | පළමු වැනි සේන<br><br>අප්‍රකටය | කාව්‍යාලංකාර පිළිබඳ උපදෙස් සැපයීම.<br><br>භික්ෂු විනය නීති පැහැදිලි කිරීම. |
| පොළොන්නරුව | ධර්ම ප්‍රදීපිකාව<br><br>මුවදෙව්දාවත<br><br>අමාවතුර<br><br>සසදාවත | ගුරුළුගොමී පඬිතුමා<br><br>අප්‍රකටය<br><br>ගුරුළුගොමී පඬිතුමා<br><br>අප්‍රකටය | පාලි බෝධි වංශයේ එනපද 205 කට අර්ථ විවරණ සැපයීම.<br><br>මඛාදේව ජාතකය ඇසුරෙන් බුදුගුණ කාව්‍යයක් කිරීම.<br><br>බුදුන්ගේ පුසදම්ම සාරථී ගුණය ස්තර කිරීම.<br><br>සස ජාතකය ඇසුන් බුදුගුණ වණනා කිරීම. |
| දඹදෙණිය | සද්ධමරත්නාවලිය<br><br>පූජාවලිය<br><br>කව් සිළුමිණ | ධර්මසේන හිමි<br><br>මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි<br><br>දෙවැනි පැරකුම්බා රජු | ධම්ම පදට්ඨ කථාවේ එන කථා පරිවර්තනය කරමින් ගැමියන්ට ඉදිපත් කිරීම.<br><br>තුන්ලෝක වාසින්ගෙන් බුදුරදුන් පූජා ලැබීමට සුදුසු බව විස්තර කිරීම.<br><br>කුස ජාතකය ඇසුරින් බෝධි සත්ව චරිතය වර්ණනා කිරීම. |
| කුරුණෑගල | ථූපවංශය<br><br>ජාතක පොත<br><br>දළදා සිත | විද්‍යා චක්‍රවර්තී<br>පරාක්‍රම පණ්ඩිත<br>සිව්වන පැරකුම්බා රජුගේ ආරාධනාවෙන් කතෘ මණ්ඩලයක්<br><br>- | රුවන්වැලි මහා සෑයේ ඉතිහාසය කියාපෑම බෝසතුන්ගේ අතීතභවයන් පිළිබඳ කතා ඉදිරිපත් කිරීම.<br><br>දළදා වහන්සේගේ ඉතිහාස කතාව සහ ඊට සම්බන්ධ පූජා විධි විස්තර කිරීම. |

| යුගය | සාහිත්‍යය නිර්මාණය | කතෘවරයා | අරමුණු |
|---|---|---|---|
| කුරුණෑගල | සිංහල බෝධි වංශය<br><br>එළු අත්තනගලු වංශය | විල්ගම්මුල මහතෙර<br><br>අප්‍රකටය | ජයසිරි මහ බෝ සමිදුන්ගේ ඉතිහාස කථාව කියා පෑම.<br><br>පාලි අත්තනගලු වංශය සිංහලයට නැගීම. |
| ගම්පොල | නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය<br><br>සද්ධාමාලංකාරය | දේව ජයබාහු හෙවත් දෙවන ධර්ම කීර්ති හිමි<br><br>දෙවැනි ධර්ම කීර්ති හිමි | ලක්දිව ඉතිහාසයත් බුද්ධ ශාසනයේ ඉතිහාසයත් විස්තර කිරීම.<br><br>පාලි මූලාශ්‍ර වල කතා සිංහලෙන් දක්වා ජනතාව තුල ශ්‍රද්ධාව වර්ධනය කිරීම. |
| කෝට්ටේ | සද්ධමරත්නාකරය<br><br>ලෝවැඩ සඟරාව<br><br>බුදුගුණ අලංකාරය කාව්‍යශේකරය<br><br>ගුත්තිල කාව්‍ය | විමල කීර්ති ධම්මදින්න හිමි<br><br>වීදාගම හිමි<br><br>වීදාගම හිමි තොටගමුවේ ශ්‍රී රාහුල හිමි<br><br>වෑත්තෑවේ හිමි | පාලි සිංහල බණ පොත් වල එන කරුණු සංග්‍රහ කරමින් බණකතා සංග්‍රහයක් ඉදිපත් කිරීම..<br><br>සරල බසින් ධර්ම කරුණු විස්තර කිරීම.<br><br>බුදුගුණ කවියෙන් කීම.<br>සත්තුභක්ත ජාතකය ඇසුරින් බෝධි සත්ව චරිතය වර්ණනා කිරීම.<br><br>ගුත්තිල ජාතකය ඇසුන් ජනයාට කාව්‍යයක් නිර්මාණය කිරීම |

## ක්‍රියාකාරකම

01. ඔබ කැමති ඓතිහාසික බෞද්ධ කලා නිමාණයක් චිත්‍රයට නඟන්න.

02. කෝට්ටේ යුගය බෞද්ධ සාහිත්‍යයය තුල ස්වර්ණමය යුගය වන්නේ දැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

03. නිර්මාණාත්මක බෞද්ධ චිත්‍ර රැස්කර පොත් පිංචක් නිර්මාණය කරන්න.

**22 වන පාඩම**

**ණය නොවී සතොසින ගෙවමු දිවි මග දැහැමින**

බුද්ධ දේශනාවට අනුව ණය නොවී ජීවත් වීම මිනිසාට සැපයකි. ඒ සඳහා සමජීවිකතාවය නම් ගුණය දියුණු කර ගැනීමට බුදු දහම උපදෙස් සපයයි. ඉන් කියවෙන්නේ ආදායම සහ වියදම සමසේ පවත්වා ගෙන යායුතු බවයි. එසේ කිරීමට නම් මහිච්ඡතාවය (අසීත බලාපොරොත්තු) අතහැර අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට බුදු දහම උපදෙස් සපයයි. ණය නොවී විඳින සැපය අනණ සුඛය ලෙස හඳුන්වයි. දුසිත් නොකර නිවැරදි ජීවිත ගත කිරීමෙන්ද ජීවිතය දැහැමින් සතුටින් ගෙවිය හැකි බව බුදු දහම අවධාරණය කරයි. එය අනවජ්ජ සුඛය ලෙස හඳුන්වයි.

අනණ සුඛ - ණය නොවීමෙන් විඳින සැපය

අනවජ්ජ සුඛ - නිවැරදි ජීවිත ගත කිරීමෙන් විඳින සැපය

අනවජ්ජ සුඛයේ දී නිවැරදි ව සිත, කය, වචනය වෙහෙසවා වැඩකල යුතුය.

නිවැරදි වචී කර්ම - සත්‍ය කතා කිරීම , ප්‍රිය වචන කතා කිරීම

නිවැරදි කාය කර්ම - හොරකම් නොකිරීම , ප්‍රාණඝාතය නොකිරීම

නිවැරදි මනෝ කර්ම - ලෝභ , ද්වේෂ , මෝහයෙන් තොරව කටයුතු කිරීම.

දැහැමි දිවිපැවැත්ම සම්මා ආජීව නමින් හඳුන්වයි. ඒ සඳහා දැහැමි ධනෝපායන ක්‍රම වලින් ධනය උපයා ගත යුතුය. ඒ සඳහා,

උත්සාහය , වීර්යය, දෑතේ ශක්තිය , දැහැමි රැකියා , අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. බුදුදහම අනුමත කරන දැහැමි රැකියා,

1. ගොවිතැන
2. ධාර්මික වෙළඳාම
3. ගුරු සේවය (රාජ්‍ය සේවය)
4. ගවයන් රැක බලා ගැනීම.
5. හස්ත කර්මාන්තය

ධාර්මික වෙළදාමේ දී හොරට කිරීම , මැනීම ආදිය නොකළ යුතු බව බුද්ධ දේශනාවේ සඳහන් වේ.

උදා :- තුලා කූට (හොරට කිරීම)

මාන කූට (හොරට මැනීම)

කංස කූට (ව්‍යාජ භාණ්ඩ අලෙවිය)

ධාර්මිකව ධනය උපයා ගැනිමේ දී නොකළ යුතු රැකියා කීපයක් ද හඳුන්වා දී ඇත. උදා :-

1. සතුන් වෙළදාම
2. මස් වෙළදාම
3. අවි ආයුධ වෙළදාම
4. වස විස වෙළදාම
5. මධ්‍යසාර වෙළදාම

"මල නොතලා රොන් ගන්නා බඹරෙකු සේ වේයෙකු තුඹසක් බඳින්නා සේ
දැහැමින් සෙමින් ධනය උපයා ගැනීමට බුදු දහමින් උපදෙස් ලැබේ."

## ක්‍රියාකාරකම

01. සම්මා කම්මන්ත යන්න ධර්මානුකූලව පැහැදිලි කරන්න.

02. ණය කාරයෙකු වීමෙන් කෙනෙකුට මුහුණ දීමට සිදුවන ගැටලු මොනවා ද?

03. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අධාර්මික ධනෝපායන මාර්ග නිසා සිදුවන සමාජ අයහපත පැහැදිලි කරන්න.

## 23 වන පාඩම

# රාජා භවතු ධම්කෝ

බෞද්ධ ඉගැන්වීමට අනුව රජු හෙවත් රටක පාලකයා නිරතුරුවම දැහැමි විය යුතුය. ජනතා හිතවාදී පාලනයකට නම් දැහැමි පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් ද බුදු දහමේ සඳහන් වේ. ජාතක පාලියේ එන මහා හංස ජාතකයෙහි සඳහන් දස රාජ ධර්ම එබඳු දැහැමි පිළිවෙත් වලින් එකකි. එය පහත දක්වා ඇත.

දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං

අක්කෝධං අවිහිංසඤ්ච - ඛන්තිඤ්ච අවිරෝධනං

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | දානය | 2. | සීලය | 3. | පරිත්‍යාගය | 4. | ඍජු බව | 5. | මෘදු බව |
| 6. | තපස | 7. | අක්‍රෝධය | 8. | අවිහිංසාව | 9. | ඉවසීම | 10. | විරුද්ධ නොවීම. |

දානය - දැහැමි පාලකයෙකු විසින් සැලසුම් සහගතව රටවැසියන්ගේ ආර්ථික සමෘද්ධිය උදාකරලීමේ අරමුණින් සම්පත් බෙදා දීම දානයයි.

උදා :- කෘෂිකර්මාන්තයේ යෙදෙන්නන්ට අවශ්‍ය භූමිය , කෘෂි බීජ , කෘෂි උපකරණ ලබා දීම.

වෙළදාමේ යෙදී සිටින අයට අවශ්‍ය මූලික ධනය ලබාදීම.

රාජ්‍ය සේවයේ නිරත අයට ආහාර පාන හා වැටුප් ලබාදීම.

ජනතාවට අවශ්‍ය ආහාරපාන ඇඳුම් පැළඳුම් නිවාස බෙහෙත් ආදිය ලබාදීම.

සීලය - පාලකයා කය වචනය සංවර කරගත් අයෙකු විය යුතුය. පඤ්ච සීලය ආරක්‍ෂා කරමින් ආදර්ශමත් ජීවිතයක් ගත කරන්නෙක් විය යුතුය.

පරිත්‍යාගය - පාලකයා සිය ධනය , කාලය කායික මානසික ශ්‍රමය රටවැසියාගේ යහපත වෙනුවෙන් කැප කිරීමයි.

ඍජු බව - ඡන්ද , ද්වේෂ, භය ,මෝහ ආදියෙන් කිසිදු බලපෑමකට යටත් නොවී කෙළින් තීරණ ගෙන කටයුතු කිරීම.

මෘදු බව - ජනතා ගැටලු වලදී අර්බුද වලදී ඒවාට හොඳින් අවධානය යොමු කිරීමට තරම් පාලකයා කාරුණික වීමයි. රළු ප්‍රතිපත්ති වලින් තොරව මානුෂික වීමයි.

තපස - සන්සුන් ඉදුරන් ඇතිව ඉන්ද්‍රිය දමනයෙන් ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමයි.

අක්‍රෝධය - විද්ධවාදීන්ට , කායික සහ මානසික පීඩන ඇති කරන අයට මෛත්‍රී කිරීමයි.

අවිහිංසාව - කිසිවෙකුටත් කායික මානසික පීඩනයක් ඇති නොවන ලෙස පාලනය ගෙන යාමයි.

ඉවසීම - ක්ෂාන්තිය නමින්ද හඳුන්වයි. සියලු කරදර බාධක ද දරා දැනීමයි.

අවිරෝධතාව - විරුද්ධ අදහස් දරන අය කෙරෙහි ද ඇහුම්කන් දී ගැටීමකින් තොරව සාමකාමීව පාලනය ගෙන යාමයි.

## ක්‍රියාකාරකම

01. දසරාජ ධර්ම මඟින් යහපත් පාලනයක් ගෙන යා හැකි ආකාරය පැහැදිලි කරන්න.

02. අහිංසාවාදීව රට පාලනය කළ ලාංකීය පාලකයින් නම් කරන්න.

03. ඉවසීමෙන් සැනසීම ලැබෙන අයුරු පැහැදිලි කරන්න.

## 24 වන පාඩම

## නිවන් මගෙහි බීජය ශ්‍රද්ධාවයි.

තෙරුවන් ගුණ දැන හැඳින ඇතිවන්නා වූ පැහැදීම ශ්‍රද්ධාවයි. සද්ධෝ හෝති සද්දහති - රතනත්තයං කම්මඵලන්ති යන්නෙන් ඒ බව කියැවේ.

බෞද්ධයෙකු විසින් වැඩිය යුතු බල පහක් ඇති බව දේශනා කරන බුදුන්වහන්සේ එහි පළමු වැන්න ලෙස දක්වා ඇත්තේ ශ්‍රද්ධාවයි.

උදා:- සද්ධා බලය , විරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය , යනුවෙනි.

ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද :-

1. අමූලිකා ශ්‍රද්ධා
2. ආකාරවති ශ්‍රද්ධා

1. අමූලිකා ශ්‍රද්ධා - අචාරශීලිව කරුණු හරි හැටි විමසා නොබලා ඇතිවන පැහැදීමයි. බුදු දහම මෙය ප්‍රතික්ෂේප කරයි. අවිචාරවත් පිළිගැනීමක් ලෙස හඳුන්වයි.

2. ආකාරවති ශ්‍රද්ධා - තෙරුවන් කෙරෙහි විචාරශීලිව පදනම් සහිතව කරුණු විමසා බලා ඇතිවන පැහැදීමයි. ආකාරවතී ශ්‍රද්ධාවේ ප්‍රභේද හයකි. බුදුදහමේ මෙසේ එය දක්වා ඇත.

1. සම්පසාදන ලක්ඛණ සද්ධා
2. සම්පක්කන්ධන ලක්ඛණ සද්ධා
3. සද්දහන සද්ධා
4. ඔක්කප්පන සද්ධා
5. ආගම සද්ධා
6. අධිගම සද්ධා

බුදුදහම පිළිගනු ලබන්නේ ආකාරවතී ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ඇති තැනැත්තා ධර්මය ශ්‍රවණය කරයි , ධර්ම මාර්ගයෙහි ගමන් කරයි. පින් දහම් රැස් කරයි. අවසානයේ නිවන කරා ගමන් කරයි.

### ක්‍රියාකාරකම

01. ශ්‍රද්ධාව යනු කුමක් දැයි සරලව පැහැදිලි කරන්න.
02. ශ්‍රද්ධාවේ ප්‍රභේද පැහැදිලි කරන්න.
03. ශ්‍රද්ධාව ඇති කරගත් තැනැත්තෙකු සතු ලක්ෂණ පැහැදිලි කරන්න.